නමෝ බුද්ධාය

දාහ අට වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක:157

ශ්‍රී. බු. ව. 2557 2013 ජූලි 22 ඇසල කලාපය

# ශ්‍රේෂ්ඨ ජීවිතයක ස්වභාවය

සැවැත්නුවර නව ජේතවනාරාමාධිපති, භාරතයේ ප්‍රධාන සංඝ නායක, මහාචාර්ය

**අතිපූජ්‍ය කඹුරුපිටියේ චන්ද්‍රරතන හිමිපාණන් විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**කිංසුධ විත්තං පුරිසස්ස සෙට්ඨං**
**කිංසු සුචිණ්ණො සඛමාවහාති?**
**කිංසු හවේ රසානං?**
**කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං?**

**සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං**
**ධම්මො සුචිණ්ණො නසුඛමාවහාති**
**සාච්චං හවේ සාධුතරං රසානං**
**පඤ්ඤා ජීවිං ජීවිතමාහු සෙට්ටං**

මේ ලෝකයෙහි මනුෂ්‍යයාට කවර නම් වස්තුවක් උතුම්වේද? මනා කොට පුරුදු කරන ලද කවර නම් දෙයකින් කායික මානසික සතුටක් ලැබේද? මෙලොව ඇති රස වලින් උසස්ම රසය කුමක්ද? කවර අන්දමින් ජීවත්වන්නන්ගේ ජීවිතය ශ්‍රේෂ්ඨවේද?

මේ ලෝකයෙහි මනුෂ්‍යයාට ඇති උසස්ම වස්තුව ශ්‍රද්ධාවයි. හෙවත් හිතේ ඇතිවන සතුටයි. මනාකොට පුරුදු කරන ලද සුචරිත ධර්මයෙන් කායික මානසික සැප ලැබෙයි. රසයන් අතරින් සත්‍ය වචන නමැති රසය ඉතා මිහිරියි. නුවණින් ජීවත්වන්නාගේ ජීවිතය ඉතා ශ්‍රේෂ්ඨය.

පින්වතුනි,

බුද්ධකාලීන භාරතයේ විසූ අනේක ජනජාතීන් ගැන පාලිසාහිත්‍යයෙහි නොයෙක් තැන්වල විස්තර කොට තිබේ. දුරාතීතයේ භාරතයේ ආධිපත්‍යය දැරූ සුර සහ අසුර යන මේ ජාතීන් දෙක අතර හටගත් භයානක යුද්ධයක් නිසා මේ ජාති දෙකම විනාශ

වී ගොස් ඇති බව පෙනේ. ඒ හැරුණු විට අතීත භාරතයේ දේව, මනුස්ස, නාග, ගන්ධබ්බ, කින්නර, කුම්භාණ්ඩ, යක්ෂ, රාක්ෂස පිසාච ප්‍රේත ආදී නොදියුණු ජන ජාතීන් අයත් පිරිස ඉතා අධික විය. ඔවුහු සම්පූර්ණ භාරතයේම පැතිර සිටි පිරිසක් බව ද පෙනේ. දේව ජාතියට අයත් වූ අය කඳු ආශ්‍රයේ ද, නාග ජාතියට අයත් අය ගංගා නිම්නයේ මෙන්ම මුහුදු කරයේද යක්ෂ ජාතිකයෝ පර්වත ප්‍රදේශවල අධිකව විසූ බව පෙනේ ආලවකයන් රජුගේ භවන පිහිටා තිබුණේත් ගංගා නම් ගඟ ආශ්‍රිත ගල් පර්වතයක් මත බව පුරාවිද්‍යාඥයන්ගේ මතයයි.

බුදුරජාණන් වහන්සේ අලව් නුවර කිහිප වරක් වැඩිය බව පාලි ග්‍රන්ථ වල සඳහන් වේ. උන් වහන්සේ සඳහා අලව් නුවර ,අග්ගාලව චේතිය, නමින් විහාරයක් විය. වරක් තථාගතයන් වහන්සේ අලව් නුවර ආලවක නම් යක් රජුගේ භවනට වැඩි යක්ඛිසෝ වරුන්ට දහම් දෙසූහ. මේ බව දැනගත් ආලවක නම් යක් රජ කෝපයෙන් දැවි දැවී එහි පැමිණ බුදුරජාණන් වහන්සේට මෙසේ අණ කළහ. **"නික්ඛම සමණ"** ඉද ශ්‍රමණය මගේ භවනයෙන් නික්ම යව. **"සාධාවුසො"** ආයුෂ්මාන් බෙහොම හොඳයි. කියා බුදුරජාණන් වහන්සේට භවනයෙන් පිටතට වැඩියහ. මේ ශ්‍රමණයාට හොඳ පාඩමක් උගන්වන්න ඕනෑ යයි සිතූ යක්රජ බුදුන්වහන්සේට නැවත මෙසේ අණ කළහ.

**"පවිස සමණ"** ශ්‍රමණය භවන තුළට ඇතුල්වෙව. බුදු රදහු යක්ෂයා ගේ මෙම අණටත් කීකරු වී භවන තුලට වැඩම කළහ. මෙසේ තුන් වරක්ම යක්ෂයාගේ අණ පරිදි බුදුරදුන් නිවසින් පිටතටත් ඇතුලටත් වැඩි සේක. සතර වැනි වරටත් භවනයෙන් නික්ම යන ලෙස යක්ෂයා විසින් කරන ලද අණ ඇසූ බුදුරජාණන් වහන්සේ නිර්භීතව නැගී සිට තර්ජනාත්මකව යක් රජුට මේසේ වදාළහ. **"නඛ්වා හංතං ආවුසෝ නික්ඛමිස්සාමි යං තෙ කරණීයං තං කරොහි"** ආයුෂ්මාන් මම පිට නොවන්නෙමි. ඔබට කළ හැක්කක් වේ නම් එය කරව. බුදුරදුන්ගේ මෙම අභියෝගය ඇසූ යක්රජ තෙම මේසේ සිතීය. "මගේම භවනය තුළ මට මෙසේ අභියෝග කරන තැනැත්තා එසේ මෙසේ කෙනෙක් නොවිය යුතුයි"

එය කෙසේ වෙතත් තමාගේ පරාජය සඟවා ගැනීම් වස් යක්රජ නැවතත් මෙසේ කීය. ශ්‍රමණය! මම ප්‍රශ්නයක් අහන්නෙමි එයට පිළිතුරුදිය හැකි නොහැකි වී නම් ඔබේ සමිත අවුල් කොට ළය පලා කකුල් දෙකෙන් අල්වා ගංගානම් ගඟේ අනික් පැත්තට විසි කරන්නෙමි. යි ගර්ජනා කළේය.

මෙම තර්ජනයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. **"ආයුෂ්මාන් "** ඔබ සිතන විධියට මගේ සිත වික්ෂිප්ත කල හැකි හෝ ළය පැළිය හැකි හෝ පයින් ගෙන ගංගා නම් ගඟේ එතරට දැමිය හැකි පුද්ගලයෙක් මේ තුන් ලෝකයේම නැති බව තමා දැන ගත යුතුයි. ඔය වහසි බස් පැත්තක තබා තාමාට දැන ගත යුතු ප්‍රශ්නයක් වේ නම් නොවලහා අසන ලෙස තථාගතයන් වහන්සේ වදාළහ. ක්‍රමයෙන් සන්සුන් බවට පැමිණි යක් රජ බුදුරජාණන් වහන්සේගෙන් මුලින්ම සඳහන්

කළ ප්‍රශ්නය විචාළහ.

මේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් බුදු රජාණන් වහන්සේ මේ ලෝකයේ මනුෂ්‍යයාහට ඇති උසස්ම වස්තුව ශ්‍රද්ධාව හෙවත් සිතේ ඇතිවන සතුටයි. මනාකොට පුරුදු කරන ලද සුචරිත ධර්මයෙන් කායික මානසික සැප ලැබෙයි. රසයන් අතුරෙන් සත්‍ය වචන නැමැති රසය ඉතා මිහිරිය. නුවණින් ජීවත්වන්නාහුගේ ජීවිතය ඉතා ශ්‍රේෂ්ඨ ජීවයයි කිව හැකි යයි වදාළහ.

ඉන්පසු යක්රජ ඊළඟ ප්‍රශ්නය තථාගතයන් වහන්සේගෙන් මෙසේ විචාළේය.

කවර ප්‍රකාරයකින් කමාදි සතර ඕඝයෙන් එතර වේද? කවර ප්‍රකාරයකින් සංසාර සාගරයෙන් එතර වේද? කවර ප්‍රකාරයකින් සසර දුක් දුරු කෙරේද? කවර ප්‍රකාරයකින් පිරිසිදු විය හැකිද? මෙය පිලිතුරු දෙන බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

ශ්‍රද්ධාව කරණකොට ගෙන සැඩ පහරින් එතෙර විය හැක. අප්‍රමාදයෙන් සංසාර සාගරය තරණය කළ හැක. වීර්යයෙන් සසර දුක් දුරු කළ හැක. ප්‍රඥාවෙන් පිරිසිදු විය හැක.

බුදුරජාණන් වහන්සේගේ උත්තරයෙන් ඉතා සතුටට පැමිණි යක් රජ ඔහුගේ ඊළඟ ප්‍රශ්නය මෙසේ විචාළේය.

ප්‍රඥාව කෙසේ ලැබිය හැකිද? ධනය කෙසේ ලබා ගත හැකිද? කීර්තිය කෙසේ ලැබිය හැකිද? මිත්‍ර ලාභය කෙසේ ලබා ගත හැකිද? කෙසේ නම් ඉහලෝක පරලෝක දෙකේම ශෝක නොකරන්නේ වේද?

මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන තථාගතයන් වහන්සේ මෙසේ වදාළහ. කුසල, කුසල ධර්මයන්ගේ විපාක දන්නා වූ අප්‍රමාදී පුද්ගලයා රහතන් පැමිණි නිවසට පැමිණෙනු පිණිස බණ ඇසීමෙන් ප්‍රඥාව ලබා ගනී.

උපාය කෞශල්‍යයෙන් යුතු වීර්යවාන් පුද්ගලයා ධනය ලබා ගනී. සත්‍යය භාවිතා කිරීමෙන් කීර්තිය ලබා ගනී. පරිත්‍යාග ශීලී පුද්ගලයාට මිතුරන් එකතු වේ.

ගිහි ගෙයි වසන පුද්ගලයෙකුට සත්‍යය, ධර්මය, ධෛර්යය සහ පරිත්‍යාග යන මේ සතර ධර්මයෝ වෙද්ද ඔහු එලොව මෙලොව දෙකේම ශෝක නොකරන්නේය.

මේ අනුව සත්‍යය, ඉන්ද්‍රිය දමනය, පරිත්‍යාගය සහ ක්ෂාන්තිය යන මේ සතර ධර්මයන්ට වඩා උසස් ධර්මයක් මේ ලොව නැත්තේය. මේ ගැන සැකයක් වේ නම්

අනික් මහණ බමුණන්ගෙනුත් අසා දැන ගන්න යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. මේ ඇසූ ආලවක යක්රජ "ස්වාමීනි ඔබ වහන්සේ වදාළ ධර්මය මම මුදුණින් පිළිගනිමි. ඒ ගැන මට කිසිම සැකයක් නැත. දක්ෂිණාර්හ පුද්ගලයන් කවුරුන්දැයි දැන් මම දනිමි. අනේ ඔබවහන්සේ මට ම අනුකම්පා කොට අලෙවී නගරයට වැඩිය බව මට දැන් වැටහෙයි. මින් පසු මම ගමක් ගමක් නගරයක් නගරයක් පාසා ගොස් තුනුරුවන්ගේ ගුණ ගායනා කරන්නෙමි. අද සිට මා තුණුරුවන් සරණගිය උපාසකයෙක් හැටියට ධාරණය කන සේක්වා යි" ප්‍රීතියෙන් ඉපිල යමින් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්වා සිටියේය.

බුදුරජාණන් වහන්සේ විසින් ආලවක යක්ෂයා දමනය කිරීමේදී ගත් මනොවෛඥානික පියවර කාගේත් සැළකිල්ලට භාජනය විය යුතු කරුණකි. යක් රජ කෝපයෙන් කළ අණට බුදුරජාණන් වහන්සේ ගත් ශාන්තිමය පියවර නිසා යක්ෂයා ගේ කෝපය ක්‍රමයෙන් නිවී ගියේය. උන් වහන්සේගෙ මම ස්ථානෝචිත සත් ක්‍රියාව නිසා විශාල සටනක් සිදුවිය යුතු තැන අපරිමිත ශාන්තියක් ඇති විය.

මෙය ආදර්ශයට ගත යුතු සාර්වභෞමික මහගු ධර්මතාවයකි. ගෙදර දොර අඹු සැමියන් අතර පවා ඇති වෙන ප්‍රශ්න වලදී මෙය ආදර්ශයට ගත හැකිය. සැමියා කෝපයෙන් සිටින විට අඹුව ශාන්ත විය යුතුයි. එසේම අඹුව කෝපයෙන් සිටින විට සැමියා ශාන්ත විය යුතුයි. බුදුරජාණන් වහන්සේගේ මෙම ආදර්ශමය ඉගැන්වීම් බෞද්ධ අබෞද්ධ දෙපක්ෂයටම අදාලවන ධර්මතාවයකි.